# ජපන් තානාපති කාර්යාලය

නො-20, ග්‍රෙගරි පාර, කොළඹ 07, ශ්‍රී ලංකා
දුරකථන අංකය: +94-11-2693831-3, +94-11-2698629
ඊමේල් : cultujpn@slnet.lk


# පුවත්පත් නිවේදනය
# 2014 පෙබරවාරි 21

## ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ආපසු පදිචි වූවන්ගේ ජීවන වෘත්තීන් ව්‍යාපෘතියට ජපානය රු. දශ ලක්ෂ 70 ක් ලබා දේ

ජපන් රජය මුලතිවු සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ආපසු පදිංචි වූවන්ගේ ජීවන මාර්ග සහ ජන ජීවිතය ශක්තිමත් කිරීමට ආධාර වශයෙන් ඇමරිකානු ඩොලර් 543,000 ක් ( ආසන්න වශයෙන් රු. දශ ලක්ෂ 70 ) ලබා දී ඇත. මෙම මුදල ලබා දෙන්නේ ජපාන රජයෙන් අරමුදල් සපයන ජපාන – රාජ්‍ය නොවන සංවිධාන සහයෝගිතාවය යටතේ උතුරු ප්‍රදේශයේ නැවත පදිංචි කළ ප්‍රජාවගේ ජීවන වෘත්තීන් වැඩි දියුණු කිරීම සඳහා ජපාන රාජ්‍ය නොවන සංවිධානයක් වන JEN ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහාය.

මුලතිවු සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ආපසු පදිංචි වූවන්ගේ ජීවන මාර්ග සහ ජන ජීවිතය ශක්තිමත් කිරීමට ආධාර කිරීම නම් මෙම ව්‍යාපෘතියෙන් කෘෂිකාර්මික ළිං ඉදිකිරීමෙන්, වතුර පොම්ප වැනි උපකරණ ලබා දීමෙන් කෘෂිකර්මාන්තය සඳහා වැඩ මුළු පැවැත්වීමෙන් සහ සමුපකාර සමිති පිහිටුවීමෙන් ප්‍රජාවගේ ජීවන වෘත්තීන් සහ හැකියාවන් නගා සිටුවීමට හා පුනරුත්ථාපනයට ආධාර කරනු ඇත. මෙම ව්‍යාපෘතියෙන් සෘජුව හා වක්‍රව පවුල් 240 කට ආසන්න සංඛ්‍යාවකගේ ජල සැපයුම ස්ථාවර කිරීමෙන්, ජීවන වෘත්තීන් සහ ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම හා ආදායම් තත්වය වැඩි දියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය සාමය හා සමෘද්ධියට දායක වන රටක් ලෙස ජපානය, ශ්‍රී ලංකාවට ආධාර කිරීමේ දී සාමය හා යළි ඉදිකිරීම ස්ථාවර කිරීම මෙන්ම සංවර්ධනය සඳහා මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන දැක්මක් කෙරේ අවධානය යොමු කරයි. ඒ අනුව ජපානය යළි ඉදි කිරීමට හා ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමට ඉහළ ප්‍රමුඛ තාවයක් ලබා දේ. ජපානය ශ්‍රී ලංකාවේ චිරස්ථායී සංවර්ධනයට හා සමෘද්ධියට, සාමය හා ප්‍රතිසංධානය පූර්ව කොන්දේසියක් බව විශ්වාස කරන නිසා සාම ක්‍රියාවලියට පූර්ණ සහයෝගය ලබා දේ.

''1994 දී ස්ථාපනය කරන ලද JEN ලොව පුරා ගැටුම් හා ස්වභාවික ව්‍යසනයන්ගෙන් විපතට පත් ජනතාවට හදිසි ආධාර සහ ස්ව ශක්තිය සඳහා ආධාර ලබා දෙන අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානයකි. මෙම සංවිධානය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූයේ 2004 සුනාමියෙන් පසුවය. එම මෙහෙයුම් අවසන් කළ වහාම 2007 සිට නැගෙනහිර ගැටුම් වලින් විපතට පත් ජනතාවට ද 2009 සිට උතුරේ ජනතාවට ද ආධාර කිරීමට JEN ආයතනයේ අවධානය යොමු

වූයේයැ''යි JEN ආයතනයේ කොළඹ කාර්යාලයේ පරිපාලන සහ මුදල් නිලධාරි නසුඩා මහතා කියයි.

2014 මාර්තු 1 වැනිදා සිට මෙම ආයතනය මුලතිවු සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ආපසු පදිංචි වූවන්ගේ ජීවන මාර්ග සහ ජන ජීවිතය ශක්තිමත් කිරීමට ආධාර කිරීමේ නව ව්‍යාපෘතියක් ආරම්භ කරයි.

ප්‍රදානය කිරීමේ ගිවිසුම 2014 මාර්තු 1 වැනිදා ශ්‍රී ලංකාවේ ජපන් තානාපති අතිගරු නොබුහිතෝ හොබෝ මහතා සහ JEN සංවිධානයේ පරිපාලන සහ මුදල් නිලධාරි ටොමු නසුඩා අතර කොළඹ තානාපති නිවසේ දී අත්සන් කෙරිණ.

* * * *

වැඩිදුර විස්තර සඳහා විමසන්න ජපන් තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය,
දුරකථන අංකය: +94-11-2693831-3, දිගුව: 25